*විදේශ රැකියාවක නිරත ශ්‍රී ලාංකික ඔබ සැමට*

*රාජ්‍ය විශ්‍රාම වැටුපක රැකවරණය*

ලෝකයේ කුමන රටක සේවය කළද ශ්‍රී ලාංකික ඔබ සැමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් ක්‍රියාවට නංවා ඇති සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගත හැකිය. විදේශගතව සිටින ඔබ සැමට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන එකම ආයතනය මෙම මණ්ඩලයයි.

මව්බිම වෙත විදේශ විනිමය උපයමින් මහඟු මෙහෙවරක් ඉටුකරන ඔබට සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම තුළින් වයස අවුරුදු 60 සිට මාසිකව ජීවිතාන්තය දක්වා විශ්‍රාම වැටුප් ලැබීම, විශ්‍රාම වැටුප් ලබමින් සිට මිය ගිය විට සාමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ලැබීම, විශ්‍රාම පූර්ව සමයේදී අර්ධ අබලතා ප්‍රතිලාභ, පූර්ණ අබලතා ප්‍රතිලාභ, මරණ පාරිතෝෂික යන ප්‍රතිලාභ ලබාදීම සිදුකෙරේ.

මෙම යෝජනා ක්‍රමය සඳහා මේ වන විටත් විදේශ රැකියා කරන ශ්‍රී ලාංකිකයින් 7500 ඉක්මවූ ප්‍රමාණයක් සාමාජික වී සිටින අතර, මේ වන විටත් මාසිකව විශ්‍රාම වැටුප් ලබන සංඛ්‍යාව 28 කි. එසේම සාමාජික අභාවයන් වෙනුවෙන් මරණ පාරිතෝෂික 03 ක් ද මේ වන විට ගෙවීම් කර ඇත.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ ක්ෂණික ඇමතුම් අංක. 0112-886088 අමතන්න. ඔබ විදේශගතවීමට පෙර වුවද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පිහිටුවා ඇති මෙම මණ්ඩලයේ කාර්යාලය මගින්, රාජගිරිය, රාජගිරිය පාර, සමාජ ආරක්ෂණ පියසේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති දිස්ත්‍රික් කාර්යාල මගින් හා අපගේ බලයලත් නිලධාරීන් මගින් සාමාජිකත්වය ලබාගත හැකිය.

*ඔබ මේ වන විට ද විදේශ රැකියාවක නිරත අයෙකු නම්* **...............**

1. "සුරැකුම" යෝජනා ක්‍රමයට අදාළ අයදුම්පත්‍රය වෙබ් පිටුව තුළින් බාගත කර (Download) එය සම්පූර්ණ කර, ඔබ ලබාගැනීමට අපේක්ෂා කරන විශ්‍රාම වැටුපට අදාළ වාරික මුදල් මෙම මණ්ඩලයේ ගිණුම් අංක. **174402140350212 USD** (මහජන බැංකුව නුගේගොඩ ශාඛාව) එවීම මගින්,

2. **0094112 886088** අංකයට අමතා තැපැල් මගින් අයදුම්පත්‍රය ඔබගේ විදේශ ලිපිනයට ගෙන්වා ගෙන එය සම්පූර්ණ කර අදාළ වාරික මුදල අපගේ ඉහත සඳහන් බැංකු ගිණුමට බැර කිරීම මගින්

3. ශ්‍රී ලංකාවේ සිටින ඔබගේ ඥාතීන්, හිතවතුන් මගින් ඔබගේ අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාළ වාරික මුදල් සමඟ මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය වෙත, දිස්ත්‍රික් කාර්යාල වෙත, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත, ග්‍රාම නිලධාරි වෙත යොමුකිරීම මගින්

   සාමාජිකත්වය ලබාගත හැකිය.

වාරික ගෙවීම

1. ඔබ විදේශයක සිට වාරික මුදල් ගෙවන විට ගිණුම් අංක. **174402140350212 USD** (මහජන බැංකුව නුගේගොඩ ශාඛාව) විදේශ ව්‍යවහාර ගිණුමට මුදල් බැර කිරීම.

2. ඔබට අයත් ඕනෑම බැංකුවක ගිණුමකින් මෙම මණ්ඩලයේ ඉහත ගිණුමට බැංකු ස්ථාවර නියෝගයක් මගින් ගෙවීම් කිරීම.

3. ඔබේ ලංකාවේ සිටින පවුලේ සාමාජිකයින් හිතවතුන් මගින් ලංකා බැංකුව, මහජන බැංකුව වෙත හෝ මෙම මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල, ප්‍රධාන කාර්යාලය වෙත වාරික ගෙවීම සිදුකළ හැකිය.

ඔබගේ වර්තමාන අනාගතය එකලෙස සුරක්ෂිත කිරීමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය කැප වී සිටී.